CEYLON

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,993 — 1962 මාර්තු 23 වැනි සිකුරාද — 1962.3.23

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය — සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට |
|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ආදිය ... ... | — |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය ... | 483 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය ... | 483 |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය | 484 |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | 485 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — |

| | පිට |
|---|---|
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 487 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | 489 |
| "සුරාබදු ආඥාපනත" පිළිබඳ දැන්වීම් ... ... | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය

1962 අංක 112

අංකය : ඩී. 182/ආර්ඊසීපී.

### යුද්ධ හමුදාව—නිත්‍ය භට සේනාව—1962 පෙබරවාරි 23 වැනි සිකුරාදා පළ කරන ලද අංක 12,937 දරණ රජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද අංක 77 දරණ නිවේදනයට අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද සංශෝධනයක්

"පත්කිරීම" යටතේ—

"පනාගොඩ හමුදා බල සේනාවේ අණදෙන නිලධාරි වශයෙන්"

වෙනුවට

"පනාගොඩ හමුදා බල සේනාවේ අධිපති කමට"

යනුවෙන් යොදන්න.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. කියු. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1962 මාර්තු 12 වෙනිදා,
කොළඹ දීය.

3-627

1962 අංක 113

අංකය : ඩී. 22/රෙක්ව්/41.

### රාජකීය ලංකා නාවික හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීම

1962 මැයි මස 31 වෙනි දින සිට, රාජකීය ලංකා නාවික හමුදාවේ වැඩබලන ලයිතන් ආර්. ඇස්. බෙනට්.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. කියු. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1962 මාර්තු 7 වෙනිදා,
කොළඹ දීය.

3-625

## රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය

1962 අංක 114

ඒ. 13/62

1962 ජනවාරි මස 9 වැනි දින සිට සිවිල් සේවක ඒ. ඇස්. කොහොඹන් වික්‍රම මහතා නිවාඩු පිට සිටින කාලය තුළ හෝ නැවත නියමයක් කරන තුරු හෝ ප්‍රධාන රේගු අයකැමි සිවිල් සේවක ඇම්. ඇල්. ඩී. කැස්පර්ස් මහතා ස්වකීය රාජකාරිවලට අතිරේකව වරාය කොමසාරිස් වශයෙන් වැඩ බැලීමට.

**සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.**

**ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).**

**ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායකමුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායකමුදල් භාරගනු නොලැබේ.**

483—ජේ. ඇන්. බී 41739—4,831 (3/62)

ඒ. 38/61.

1961 දෙසැම්බර් මස 2 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු ප්‍රවාහන හා රජයේ වැඩ අමාත්‍යාංශයේ සහකාර ලේකම් සිවිල් සේවක ඩබ්ලිව්. ඇල්. පී. ද මැල් මහතා ස්වකීය රාජකාරි වලට අතිරේකව සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ වශයෙන් වැඩ බැලීමට.

ඒ. 394/61.

නුවර එළිය පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත සිවිල් සේවක සී. විස්වාසම් මහතා 1961 දෙසැම්බර් මස 21 වැනි දින සිට එම මස 31 වැනි දින දක්වා ස්වකීය රාජකාරිවලට අතිරේකව බදුල්ල පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත වශයෙන් වැඩ බැලීමට.

ඒ. 30/62.

1962 ජනවාරි මස 22 වැනි දින සිට ස්වදේශීය වෛද්‍ය ක්‍රම සංවර්ධන කොමසාරිස් ඩබ්ලිව්. ජේ. ප්‍රනාන්දු මහතා දිවයිනෙන් බැහැරව සිටින කාලය තුළ හෝ නැවත නියමයක් කරන තුරු සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැඩබලන සහකාර ලේකම් සිවිල් නිලධාරි පී. ආර්. ද සිල්වා මහතා සවකීය රාජකාරිවලට අතිරේකව ස්වදේශීය වෛද්‍ය ක්‍රම සංවර්ධන කොමසාරිස් වශයෙන් වැඩ බැලීමට.

ඒ. 342/61.

1962 ජනවාරි මස 19 වැනි දින සිට සහකාර පොලිස් අධිකාරි ඊ. ඇල්. අබේගුණවර්ධන මහතා දෙවැනි ශ්‍රෙණියේ පොලිස් අධිකාරිවරයෙකු වශයෙන්.

ඒ. 5/56.

ආධුනික සහකාර පොලිස් අධිකාරි පී. බී. ගුණවර්ධන මහතා 1962 ජනවාරි මස 1 වැනි දින සිට සහකාර පොලිස් අධිකාරිවරයෙකු වශයෙන්.

ඒ. 54/61.

1962 ජනවාරි මස 24 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු අධිනීතිඥ ආර්. අයි. ඔබේසේකර මහතා ඇටෝනි ජනරාල් දෙපාර්තමේන්තුවේ රජයේ අධිනීතිඥයකු වශයෙන් වැඩ බැලීමට.

සී. ජ. වල්පිට,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 මාර්තු මස 19 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය.
නැ. පෙ. 500.

3-730

---

# අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය

1962 අංක 115

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත්තේ ය :—

අංකය : ජේඑස්සී. පිපි. 6/61.

වී. මානිකවාසගර් මහතා 1962 මාර්තු 8 වැනි දින සිට, නැවත නියම යක් කරන තුරු, කොළඹ, දිස්ත්‍රික් නඩුකාර ධුරයේ වැඩ බැලීමට.

අංකය : ජේඑස්සී. පිපි. 6/61.

වී. සිව සුප්‍රමනියම් මහතා 1962 මාර්තු 8 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, මහනුවර දිස්ත්‍රික් නඩුකාර ධුරයේ, මහ නුවර, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයේ හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයේ වැඩ බැලීමට.

අංකය : ජේඒ. 11/48.

වී. සිව සුප්‍රමනියම් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1962 මාර්තු 13 වැනි දින සිට, කොළඹ, දිස්ත්‍රික් උසාවියේ අංක 51586/එම්, 47095/එම් සහ 46153/එම් දරණ නඩුවල තීන්දු දීමට, කොළඹ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑස්සී. පිපි. 4/62.

ඕ. එල්. ද ක්‍රෙට්සර් මහතා නැවත වැඩ බාරගන්නා තුරු හෝ නැවත නියමයක් කරන තුරු, එන්. සිවඥානසුන්දරම් මහතා 1962 මාර්තු 12 වැනි දින සිට, යාපනේ, දිස්ත්‍රික් නඩුකාර ධුරයේ යාපනේ, රික්වැස්ට් කොමසාරිස් ධුරයේ හා අතිරේක මහෙස්ත්‍රාත් ධුරයේ වැඩ බැලීමට.

අංකය : ජේඑස්සී. පිපි. 6/61.

එස්. ආර්. විජයතිලක මහතා 1962 මාර්තු 8 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, කොළඹ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑස්සී. පිපි. 6/61.

ඒ. එස්. පොන්නම්බලම් මහතා 1962 මාර්තු 8 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, හලාවත සහ පුත්තලමේ දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හලාවත, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා පුත්තලමේ මහෙස්ත්‍රාත් ධුරයට හා රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑස්සී. පිපි. 6/61.

ඇන්. ඒ. ද ඇස්. විජේසේකර මහතා 1946 යේ සහ 1947 තේ ලංකා (ආණ්ඩු ක්‍රම හා ස්වාධීනතා) රාජාඥාවල 54 වැනි වගන්තිය යටතේ 1962 මාර්තු 8 වැනි දින සිට, නැවත නියම යක් කරන තුරු, අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් ධුරයට.

අංකය : ජේඑස්සී. පිපි. 6/61.

ඒ. සී. ජේ. ගුණවර්ධන මහතා 1962 මාර්තු 8 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, ගම්පහ මහෙස්ත්‍රාත් ධුරයට හා රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා ගම්පහ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑම්. 2/56 (III).

වී. එම්. කුමාරසාමි මහතා 1962 මාර්තු 8 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, යාපනේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, යාපනේ, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, කයිට්ස්, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා යාපනේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑස්සී. පිපි. 6/61.

ඊ. එෆ්. ද සිල්වා මහතා 1962 මාර්තු 8 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, කුරුණෑගල, මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, කුරුණෑගල, නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, හා කුරුණෑගල, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඒ. 13/48.

ඊ. එෆ්. ද සිල්වා මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1962 මාර්තු 8 වැනි දින සිට, දකුණු කොළඹ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 14186 දරණ නඩුව අවසාන වන තුරු ඇසීමට හා තීන්දුව දීමට, කොළඹ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට, හා කොළඹ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑස්සී. පිපි. 6/61.

සී. පී. තිස්සංග මහතා 1962 මාර්තු 8 වැනි දින සිට, නැවත නියම යක් කරන තුරු, මාතර, දිස්ත්‍රික් නඩුකාර ධුරයට, මාතර, රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට, හා තංගල්ලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑස්සී. පිපි. 6/61.

සී. කෑ. එම්. සිරිමාන මහතා 1962 මාර්තු 8 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, කොළඹ, ප්‍රධාන මහෙස්ත්‍රාත් ධුරයට, කොළඹ, අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, කොළඹ, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, හා කොළඹ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑස්සී. පිපි. 6/61.

කේ. සී. ඕ. එස්. එම්. සෙනෙවිරත්න මහතා 1962 මාර්තු 8 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, ගම්පොල ක්‍රියාකරණ පිණිස මහනුවර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, ගම්පොල, මහෙස්ත්‍රාත් ධුරයට හා රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඒ. 22/48.

ඒ. ඩබ්ලිව්. ගුණරත්න මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1962 මාර්තු 16 වැනි දින සිට, හම්බන්තොට මහෙස්ත්‍රාත් උසාවියේ අංක. 33733 දරණ නඩුව අවසාන වන තුරු ඇසීමට හා තීන්දුව දීමට, හම්බන්තොට, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා තංගල්ලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑස්සී. පිපි. 6/61.

කේ. ඒ. පී. රණසිංහ මහතා 1962 මාර්තු 8 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, මහනුවර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, මහනුවර, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, මහනුවර, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, දුම්බර, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : පීඑල්/ආර්. 5/61.

සී. ආර්. රාජසිංහම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එන්. එස්. සිවප්‍රගාසම් මහතා 1962 මාර්තු 9 වැනි, 10 වැනි හා 12 වැනි දින සිට 16 වැනි දින දක්වා මඩකලපු දිස්ත්‍රික්කයේ, ඒරාවූර් කෝරලේ, බින්තැන්න පත්තුවේ හා උතුරු මාන්මුනේ, පත්තුවේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පී.එල්/පී. 7/56.

එම්. එම්. පෙරේරා මහතා නැති අතර, ඒ. ඩබ්ලිව්. ඒ. ඉමැනුවෙල් මහතා 1962 මාර්තු 2 වැනි දින කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩවිලි හත්පත්තුවේ සහ හිරියාල හත්පත්තුවේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඒ. 20/57.

බී. පී. පියසේන මහතා 1962 මාර්තු 14 වැනි දින, කිරින්ද ගම්බද උසාවියේ අංක 922 දරණ සිවිල් නඩුව ඇහීමට, මාතර දිස්ත්‍රික්කයේ කඳුබොඩ පත්තුවේ සහ ගඟබොඩ පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයට සහ වැල්ලබොඩ පත්තුවේ සහ කඩවත් සතරේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයට.

අංකය : පීඒ. 31/57.

සී. ටී. කාසිනාදර් මහතා 1962 මාර්තු 23 වැනි දින, පදිරිප්පු ගම්බද උසාවියේ අංක 4536 දරණ අපරාධ නඩුව ඇසීමට, මඩකලපු දිස්ත්‍රික්කයේ, එරුවිල්-පොරතිව්, දකුණු මාන්මුනේ පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයට හා උතුරු මාන්මුනේ පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයට.

අංකය : පීඑල්/ඩබ්ලිව්. 10/53.

ටී. බී. වැත්තැව මහතා නැති අතර, ඒ. ඩබ්ලිව්. ඒ. ඉමැනුවෙල් මහතා 1962 මාර්තු 7 වැනි, 15 වැනි හා 16 වැනි දිනයන්හි කුරුණෑගල දිස්ත්‍රික්කයේ දේවමැදි හත්පත්තුවේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට හා කටුගම්පොල හත්පත්තුවේ හා හිරියාල හත්පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඩබ්ලිව්. 10/53.

ටී. බී. වැත්තැව මහතා නැති අතර, ඒ. බී. රත්නායක මහතා 1962 මාර්තු 9 වැනි දින, කුරුණෑගල දිස්ත්‍රික්කයේ දේවමැදි හත්පත්තුවේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට හා කටුගම්පොල හත්පත්තුවේ හා හිරියාල හත්පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/පී. 7/56.

එම්. එම්. පෙරේරා මහතා නැති අතර, ඒ. බී. රත්නායක මහතා 1962 මාර්තු 10 වැනි දින, කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඋඩවිලි හත්පත්තුවේ සහ හිරියාල හත්පත්තුවේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඒ. 44/57.

කේ. බී. එම්. සී. බණ්ඩාර මහතා 1962 මාර්තු 20 වැනි දින, හබරන ගම්බද උසාවියේ අංක 427 දරණ අපරාධ නඩුව හා අංක 243 දරණ සිවිල් නඩුවද ඇහීමට, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, තමන්කඩුව පලාතේ සහ කලාගම් පලාතේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයට හා දකුණු හුරුළු පලාතේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයට.

අංකය : පීඑල්/අයි. 4/52.

ජේ. ඊ. ඉලංගන්තිලක මහතා නැති අතර, ආර්. එම්. සී. රත්නායක මහතා 1962 මාර්තු 9 වැනි දින, මහනුවර දිස්ත්‍රික්කයේ, තුම්පනේ, හාරිස්පත්තු, පාත හේවාහැට සහ උඩ හේවාහැට ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/පී. 7/56.

එම්. එම්. පෙරේරා මහතා නැති අතර, ඩී. එස්. විජේසිංහ මහතා 1962 මාර්තු 9 වැනි දින කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩවිලි හත්පත්තුවේ සහ හිරියාල හත්පත්තුවේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/යූ. 1/48.

ජී. එම්. උදලාගම මහතා නැති අතර, ජේ. ඊ. ගුණසේකර මහතා 1962 මාර්තු 9 වැනි දින, මහනුවර දිස්ත්‍රික්කයේ, දකුණු සහ නැගෙනහිර මාතලේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඒ. 17/57.

ඒ. එෆ්. එච්. ද අල්විස් මහතා 1962 අප්‍රියෙල් 9 වැනි දින, හපුගල ගම්බද උසාවියේ අංක 1939 දරණ අපරාධ නඩුව ඇහීමට, ගාලු දිස්ත්‍රික්කයේ, කඩවත් සතරේ සහ තල්පේ පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයට.

අංකය : පීඒ. 5/57.

ජේ. එස්. පෙරේරා මහතා 1962 මාර්තු 20 වැනි දින, වලගෙදර ගම්බද උසාවියේ අංක 3430 දරණ අපරාධ නඩුව ඇසීමට, කළුතර දිස්ත්‍රික්කයේ, නැගෙනහිර සහ බටහිර පස්දුන් කෝරලයන්හි සහ කළුතර තොටමුනේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයට.

අංකය : පීඑල්/පී. 6/51.

එස්. ජී. පීරිස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඊ. ගුණසේකර මහතා 1962 මාර්තු 12 වැනි දින සිට 16 වැනි දින දක්වා, මාතර දිස්ත්‍රික්කයේ මොරවක් කෝරලේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට හා වැලිගම් කෝරලේ සහ ගඟබොඩ පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/පී. 6/51.

එස්. ජී. පීරිස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. එස්. පිණිදිය මහතා 1962 මාර්තු 9 වැනි සහ 10 වැනි දිනයන්හි, මාතර දිස්ත්‍රික්කයේ මොරවක් කෝරලේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට හා වැලිගම් කෝරලේ සහ ගඟබොඩ පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/ආර්. 4/50.

එස්. පී. රාජරත්නම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එන්. එහෙම්පරම් මහතා 1962 මාර්තු 9 වැනි හා 10 වැනි දිනයන්හි, යාපන දිස්ත්‍රික්කයේ, දූපත් හා බටහිර වලිකාමම් ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/වයි. 1/48.

එස්. ඒ. යටවර මහතා නැති අතර, ඩී. පී. බී. මහදිවුල්වැව මහතා 1962 මාර්තු 15 වැනි දින, අනුරාධපුර දිස්ත්‍රික්කයේ නැගෙනහිර නුවරගම් පලාතේ සහ බටහිර නුවරගම් පලාතේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/වයි. 1/48.

එස්. ඒ. යටවර මහතා නැති අතර, කේ. බී. එම්. සී. බණ්ඩාර මහතා 1962 මාර්තු 16 වැනි දින, අනුරාධපුර දිස්ත්‍රික්කයේ නැගෙනහිර නුවරගම් පලාතේ සහ බටහිර නුවරගම් පලාතේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

ඇන්. ඒ. ද ඇස්. විජේසේකර,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 මාර්තු මස 16 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. අංකය 573,
කොළඹ 12.

3-663

---

## වෙතන් පත්කිරීම් ආදිය

**නිවැරදි කිරීමයි**

1962 මාර්තු 16 වැනි දින අංක 12,986 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වෙනි කොටසේ (I) ඡේදයේ 463 වැනි පිටුවේ "වෙතන් පත්කිරීම් ආදිය" යටතේ පලවී ඇති පලවෙනි දැන්වීමේ අංකය එහි දක්වෙන පරිදි 1962 අංක 109/2 නොව "1962 අංක 109" ලෙස කියවිය යුතුයි.

3-454

---

**1962 අංක 116**

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ ගරු අධිකරණ අමාත්‍යවරයා කෙරෙහි පවරා ඇති බලතල අනුව එතුමා විසින්—

1. එස්. වී. නඩරාජා මහතා යාපනේ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් නිලනොලත් මහෙස්ත්‍රාත්වරයෙකු වශයෙන් ද,

2. පී. ඩී. එස්. පෙරේරා මහතා බදුලු අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදන විනිශ්චයකරුවකු වශයෙන් ද,

3. ඩේවිඩ් රණවීර මහතා තංගල්ල අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදන විනිශ්චයකරුවකු වශයෙන් ද,

4. ඒ. සුප්‍රමානියම් මහතා රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථසාධක සමාගමේ සභාපති ධුරය දරණ කාලයතුල කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදන විනිශ්චයකරුවකු වශයෙන් ද,

5. එම්. ඩී. සී. අබේවර්ධන මහතා ගම්පහ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදන විනිශ්චයකරුවකු වශයෙන් ද,
පත් කර ඇත්තේ ය,

අංකය : ජේඑස්සී. පිපී. 6/61.

බී. සේනාරත්න මහතා 1962 මාර්තු 8 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, රත්නපුරේ මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා රත්නපුරේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඒ. 1/48.

එස්. ජේ. එම්. ජී. එස්. මුදන්නායක මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1962 මාර්තු 6 වැනි දින සිට, අනුරාධපුරේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 25013 දරණ නඩුව අවසාන වනතුරු ඇහීමට හා තීන්දුව දීමට, අනුරාධපුරේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට, හා අනුරාධපුරේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 12ඒ/57.

කේ. සී. ඊ. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එන්. එම්. ඒ. වික්‍රමසූරිය මහතා 1962 මාර්තු 20 වැනි දින සිට 23 වැනි දින දක්වා, තංගල්ලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, තංගල්ලේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා හම්බන්තොට, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේ.එල්. 12ඒ/57.

කේ. සී. ඊ. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. අමරසිංහ මහතා 1962 මාර්තු 22 වැනි දින, තංගල්ලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, තංගල්ලේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා හම්බන්තොට, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 16ඒ/59.

ඩී. ඊ. ධර්මසේකර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. එල්. ද සිල්වා මහතා 1962 මාර්තු 17 වැනි හා 22 වැනි දිනයන්හි, බලපිටියේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා බලපිටියේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 1සී/53.

එම්. එම්. අබ්දුල් කාදර් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. සී. කනගසිංහම් මහතා 1962 මාර්තු 20 වැනි දින, ත්‍රිකුණාමලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, ත්‍රිකුණාමලේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, අනුරාධපුරේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා අනුරාධපුරේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 29බී/61.

එස්. ඩී. ජයසුන්දර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. සේනානායක මහතා 1962 මාර්තු 8 වැනි දින, ගම්පහ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා ගම්පහ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 13ඒ/59.

ටී. ඩී. ජී. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. ඩබ්ලිව්. වික්‍රමසිංහ මහතා 1962 මාර්තු 12 වැනි දින, මාතර, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා මාතර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 52/48.

එන්. එම්. ජේ. රාජේන්ද්‍රම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඩබ්ලිව්. ද සිල්වා මහතා 1962 මාර්තු 9 වැනි දින සිට 12 වැනි දින දක්වා, කළුතර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා කළුතර, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 7ඒ/51.

ඒ. ඕ. එස්. දිසානායක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. පී. විජයතිලක මහතා 1962 මාර්තු 10 වැනි දින සිට 12 වැනි දින දක්වා, මාතලේ ක්‍රියකරණ පිණිස, මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා මාතලේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 56ඒ/57.

ටී. එස්. සාලි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ටී. ජේ. සී. පීරිස් මහතා 1962 මාර්තු 12 වැනි හා 13 වැනි දිනයන්හි, පානදුරේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා පානදුරේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 35බී/61.

ඩී. ඩබ්ලිව්. කේ. ලද්දුවහෙට්ටි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. එන්. සී. තිරුචෙල්වම් මහතා 1962 මාර්තු 20 වැනි දින, කොළඹ, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, හා කොළඹ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 40ඒ/60.

සී. එල්. ටී. මූනමලේ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. අමරසිංහ මහතා 1962 මාර්තු 17 වැනි දින සිට 19 වැනි දින දක්වා, හම්බන්තොට, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, තංගල්ලේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා තංගල්ලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 58ඒ/59.

බී. සේනාරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ටී. ආසීර්වාදම් මහතා 1962 මාර්තු 15 වැනි දින, රත්නපුරේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා රත්නපුරේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 68සී/51.

සී. වී. උදලාගම මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එෆ්. පී. සේනාරත්න මහතා 1962 මාර්තු 16 වැනි, 17 වැනි හා 19 වැනි දිනයන්හි, අනුරාධපුරේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, අනුරාධපුරේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, මන්නාරමේ හා වවුනියාවේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, වවුනියාවේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට, ත්‍රිකුණාමලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා ත්‍රිකුණාමලේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඒ. 34/48.

සී. එච්. උදලාගම මහතා 1962 මාර්තු 14 වැනි දින සිට, කෑගල්ලේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 40550 දරණ නඩුවේ තීන්දුව දීමට, කෑගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට, හා කෑගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : සී.ආර්පී/වී. 2/51.

ඩී. ඩී. විතාරණ මහතා 1962 පෙබරවාරි 20 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, බලපිටිය දිස්ත්‍රික්කයේ, බෙන්තොට-වලල්ලාවිටි කෝරලේ හා වැල්ලබොඩ පත්තුවේ ගම්බද උසාවි සභාපති ධුරයට.

අංකය : සී/ජේආර්ඒ. 3/61.

එච්. අමීන් මහතා 1962 මාර්තු 1 වැනි දින සිට මෙම ද්වීපයේ ගම්බද උසාවි සභාපති කෙනෙකු වශයෙන් ද හා 1962 මාර්තු 1 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, මඩකලපු දිස්ත්‍රික්කයේ එරුවිල්, පොරෙයිතිව් සහ දකුණු මාන්මුනේ පත්තුවේ ගම්බද උසාවි සභාපති ධුරයට හා උතුරු මාන්මුනේ පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයට.

අංකය : පීඑල්./ඩී. 6/52.

ඩී. ද සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එච්. ඩබ්ලිව්. ජේ. මුතුකුමාරු මහතා 1962 මාර්තු 9 වැනි හා 10 වැනි දිනයන්හි, පුත්තලම් දිස්ත්‍රික්කයේ, පුත්තලම් පත්තු, දෙමළ හත්පත්තු සහ කල්පිටියේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/එච්. 6/61.

පී. බී. හේරත් මහතා නැති අතර, වී. පී. අබේවික්‍රම මහතා 1962 මාර්තු 2 වැනි හා 3 වැනි දිනයන්හි බදුලු දිස්ත්‍රික්කයේ උඩකිඳ සහ වැල්ලවායේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/එස්. 13/61.

එම්. ජේ. ටී. සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, වී. ඒ. ඩබ්ලිව්. වික්‍රමසූරිය මහතා 1962 මාර්තු 9 වැනි හා 10 වැනි දිනයන්හි, තංගල්ල දිස්ත්‍රික්කයේ බටහිර ගිරුවා පත්තුවේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/එෆ්. 1/56.

ඒ. එල්. එම්. ප්‍රනාන්දු මහතා නැති අතර, ටී. කරුණාරත්න මහතා 1962 මාර්තු 1 වැනි දින මාතර දිස්ත්‍රික්කයේ වැල්ලබොඩ හත්පත්තුවේ කඩවත් සතරේ සහ වැලිගම් කෝරලේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට හා ගඟබොඩ පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

1947 සැප්තැම්බර් මස 18 වෙනි දින අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේගේ ප්‍රකාශයකින් සංශෝධිත සිවිල් නඩු විධාන සංග්‍රහයේ 372 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ අමාත්‍යවරයා විසින් සිවිල් නඩු විධාන සංග්‍රහයේ 371 වෙනි වගන්තියේ සඳහන් දිවුරුම් පත්‍ර පිළියෙල කිරීමට අවශ්‍යවන සහතික කිරීම් හෝ දිවිරීම් හෝ කරවීමට විශේෂයෙන් බලය පවරා ඇති නිලධාරියකු වශයෙන් එස්. එස්. ඒ. කරීම් මහතා කුලියාපිටියේ පිස්කල් මාර්ෂල් තැන වශයෙන් වැඩබලන කාලයතුල කුරුණෑගල අධිකරණ කොට්ඨාශය සඳහා 1962 මාර්තු මස 14 වෙනිදා සිට 16 වෙනි දින දක්වා පත්කර ඇත්තේ ය.

ජී. පී. ඒ. සිල්වා,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන
ස්ථිර ලේකම්.

1962 මාර්තු මස 19 වෙනි දින,
අධිකරණ අමාත්‍යාංශයේ දීය.

3-723

---

1962 අංක 117

## ගෘහ සේවකයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත

(115 වැනි පරිච්ඡේදය)

වෂ් 1947 ලංකා (ස්වාධීනතා) රාජ්‍ය සභා ආඥාපනතේ 8 වන වගන්තිය - යටතේ පනවනු ලැබ වෂ් 1948 පෙබරවාරි මස 5 වැනි දින අංක 9,828 දරණ ආණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද ප්‍රකාශයෙන් මද වශයෙන් සංශෝධනය කරනු ලැබූ ගෘහ සේවකයින් ලියාපදිංචි කිරීම පිළිබඳ ආඥාපනතේ (115 වැනි පරිච්ඡේදය) 3 වන වගන්තිය යටතේ ගරු කම්කරු හා ජනසතු සේවා ඇමතිතුමන් විසින් මහනුවර ගෘහ සේවකයින් ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර්තැන වශයෙන් සී. සී. පෙරේරා මහතා වෙනුවට විධායක ලිපිකරු පංක්තියේ පළමුවැනි ශ්‍රේණියේ ලිපිකරු එස්. කන්දසියා මහතා 1962 පෙබරවාරි 15 වැනි දින සිට පත් කරන ලදී.

සී. බී. කුමාරසිංහ,
කම්කරු සහ ජනසතු සේවා අමාත්‍යාංශයේ
අතිරේක ස්ථිර ලේකම්තැන.

1962 මාර්තු මස 7 වැනි දින,
කොළඹ දී ය.

3-480

---

## ආණ්ඩුවේ නිවේදන

අ. ආ. කා. අංකය : එක්ස්. 26/58.

1957 අංක 48 දරන මෝටර් රථ ගමනාගමන පනතේ 55 වැනි වගන්තිය යටතේ පිහිටුවන ලද වන්දි විනිශ්චය සභාවට පහත සඳහන් පත්වීම් 1962 මාර්තු මස 1 වැනි දින සිට කිරීමට අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ සතුටු වී ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ :—

ඒ. ඇල්. ජයසූරිය මහතා—සභාපති.

ඇස්. බී. යටවර මහතා, ඇම්. බී. ඊ.—උප සභාපති.

ඇම්. බී. සල්මන් මහතා—සාමාජික.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,
ඇන්. ඩබ්ලිව්. අතුකෝරාළ,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලය,
කොළඹ,
1962 මාර්තු මස 13 වැනි දින දී,

3-519

---

ඇල්.සී.—බී. 129/47.

අංකය : සී. 11/55.

## 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාපනත

61 වැනි වගන්තිය යටතේ ආඥාව

1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාපනතේ 61 වැනි වගන්තියේ ප්‍රකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද ආඥාව.

සී. ජ. වල්පිට,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 මාර්තු මස 19 වැනි දින,
කොළඹ දීය.

අංක 143 දරන ආඥාව

වෂ් 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාපනතේ 61 වැනි වගන්තියේ ප්‍රකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද ආඥා පහත දැක්වෙන අන්දමට, එනම් :—

1. වර්ෂ 1961 ජූනි 9 වැනි දින අංක 12,459 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද වර්ෂ 1961 මැයි 29 වැනි දින හා අංක 137 දරන ආඥාවේ සහ වර්ෂ 1961 ජූනි 9 වැනි දින හා අංක 12,459 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද වර්ෂ 1961 මැයි 29 වැනි දින අංක 138 දරන ආඥාවේ "අවවාද" යන වචනය වෙනුවට "තරවටු" යන වචනය ආදේශ කිරීමෙන් ද,

2. වර්ෂ 1961 ජූනි 16 වැනි දින අංක 12,470 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද වර්ෂ 1961 ජූනි 6 වැනි දින හා අංක 139 දරන ආඥාවේ සහ වර්ෂ 1961 අගෝස්තු 11 වැනි දින අංක 12,576 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද වර්ෂ 1961 අගෝස්තු 1 වැනි දින අංක 140 දරන ආඥාවේ "තදින් අවවාද" යන වචන වෙනුවට "තරවටු" යන වචනය ආදේශ කිරීමෙන් ද, තව දුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

3-731

---

අංකය : 33/5/10/වීසී.

## මැලේරියා රෝගය මූලෝත්පාටනය කිරීම සඳහා ගනු ලබන ලෝක ව්‍යාප්ත පරිශ්‍රමය සිහිපත් කරනු සඳහා විශේෂ මුද්දර නිකුත් කිරීම

මැලේරියා රෝගය මූලෝත්පාටනය කිරීම සඳහා ගනු ලබන ලෝක ව්‍යාප්ත පරිශ්‍රමය සිහිපත් කරනු සඳහා, 1962 අප්‍රේල් මස 7 වැනි දින ශත විසිපහේ විශේෂ තැපැල් මුද්දර නිකුත් කෙරෙන බව මහජනයාගේ දැනගැනීම පිණිස මෙයින් නිවේදනය කරනු ලැබේ. මේ මුද්දර, 1962 ඔක්තෝබර් මස 31 වෙනිදාට කලින් විකිණී අවසන් නොවුවහොත් එම දිනය දක්වා විකිණීම පිණිස තබනු ලැබේ. දැනට භාවිතා කරන එම වටිනාකම ඇති තැපැල් මුද්දර වෙළඳාම මේ කාලය තුළ තාවකාලික වශයෙන් නතර කරනු ඇත.

ජගත් සෞඛ්‍ය සංවිධානය මගින් මෙම සිද්ධිය සිහිපත් කරනු සඳහා නිර්මාණය කරන ලද සළකුණකින් සකස් කරගත් මෝස්තරයක් මෙම මුද්දරයෙහි දැක්වෙයි.

ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
මුදල් ඇමති.

1962 මාර්තු මස 12 වැනි දින,
කොළඹ, මුදල් අමාත්‍යාංශයේ දී ය.

3-552

---

එල්.සී.—බී. 32/40. ඊ/පී. 20/93 (60).

## අපරාධ නඩු විධාන සංග්‍රහය

2 වැනි වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය

නැගෙනහිර පළාතේ පොතුවිල්හි පිහිටුවන ලද පොලිස් මුරපොළ, පොලිස් ස්ථානයක් බවට අපරාධ නඩු විධාන සංග්‍රහයේ (16 වන අධිකාරය) 2 වැනි වගන්තිය යටතේ රජය විසින් ප්‍රකාශ කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඇන්. කජු. දියෙස්,
ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1962 මාර්තු 5 දින,
කොළඹ දී ය.

3-548

---

## 1958 අංක 13 දරන වරාය (නැව්බඩු) සංයුක්ත මණ්ඩලීය පනත

1958 අංක 13 දරන වරාය (නැව්බඩු) සංයුක්ත මණ්ඩලීය පනත, 1961 අංක 67 දරන වරාය (නැව්බඩු) සංයුක්ත මණ්ඩලීය පනතින් සංශෝධනය වූ පරිදි එම පනතේ 7 (1) වැනි වගන්තිය යටතේ, 1962 පෙබරවාරි මස 1 වැනි දින සිට වරාය (නැව්බඩු) සංයුක්ත මණ්ඩලීය අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් ලෙස ප්‍රධාන රේගු අයකැමි, සිවිල් නිලධාරී ඇම්. ඇල්. සී. කැස්පර්ස් සහ වරාය කොමසාරිස් වන, සිවිල් නිලධාරී ඒ. ඇස්. කොහොඹන් වික්‍රම යන මහතුන් පත්කිරීමට ගරු කම්කරු හා ජනසතු සේවා ඇමති තුමා සතුටුවී ඇති බව මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

කම්කරු හා ජනසතු සේවා අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1962 මාර්තු මස 8 වැනි දින,
කොළඹදීය.

3-481

## පඩිපාලක සභා ආඥාපනත

ඉංජිනේරු කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයෙකු වූ ඊ. ජේ. වෙන්හැම් මහතා දිවයිනෙන් බැහැරව සිටි කාලය තුළ ඔහු වෙනුවෙන් එම පඩිපාලක සභාවේ සාමාජිකයකු මෙන් වැඩ බැලීමට ගරු කම්කරු හා ජනසතු සේවා ඇමතිතුමන් විසින් පඩිපාලක සභා ආඥාපනතේ (136 වැනි ඡෙදය) 9 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ එච්. තෝමස් මහතාගේ පත්වීම මුලින් සඳහන් මහතා ආපසු දිවයිනට පැමිණ යළිත් සාමාජිකත්වයේ වැඩ භාරගත් බැවින්, කෙළවර වූ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සී. බී. කුමාරසිංහ,
කම්කරු හා ජනසතු සේවා අමාත්‍යාංශයේ
අතිරේක සථිර ලේකම්.

1962 මාර්තු මස 14 වෙනි දින,
කොළඹ දී ය.

3-550

---

## පඩිපාලක සභා ආඥාපනත

### නිවේදනයයි

පොල් වැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයකුව සිට ඉල්ලා අස්වූ ඇස්. සිල්මන් හේවා මහතා වෙනුවට එම පඩිපාලක සභාවේ සේවක නියෝජිත සාමාජිකයකු ලෙස පෙනී සිටීමට පඩිපාලක සභා ආඥාපනතේ (136 වන අධිකාරය) 9 වන වගන්තිය යටතේ ගරු කම්කරු හා ජනසතු සේවා ඇමති තුමන් විසින් ඩී. ඩී. සෙනෙවිරත්න මහතා පත් කරණ ලද බව වෂී 1943 පඩිපාලක සභා ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරණු ලැබේ.

සී. බී. කුමාරසිංහ,
කම්කරු හා ජනසතු සේවා අමාත්‍යාංශයේ
වැ. බ. සථිර ලේකම්වරයා.

1962 මාර්තු මස 16 වැනි දින,
කොළඹ දීය.

3-642

---

## 1952 කේ අංක 12 දරණ සෞඛ්‍ය සේවා පණත අංගොඩ මානසික ආරෝග්‍යශාලා මණ්ඩලය

1952 කේ අංක 12 දරණ සෞඛ්‍ය සේවා පනතෙහි 11 වෙනි වගන්තිය යටතේ 1962 මාර්තු මස 7 වෙනි දින පටන් 1962 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා ඩී. ජී. ඔබේසේකර මහතා අංගොඩ මානසික ආරෝග්‍යශාලා මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් ගරු සෞඛ්‍ය ඇමති තුමා විසින් පත් කරනු ලැබූහ.

එල්. එස්. බී. පෙරේරා,
සථිර ලේකම්.

1962 මාර්තු මස 7 වෙනි දින,
කොළඹ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ දී ය.

3-527

---

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

පහත පෙනෙන උපලෙඛනයේ සඳහන් නියෝග මවිසින් අනුමත කරණු ලැබූ බව 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 1 වෙනි වගන්තියේ 7 වෙනි අතුරු වගන්තිය යටතේ මෙයින් දනුම දෙමි.

ටී. බී. ඉලංගරත්න,
වාණිජ, වෙළෙඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ ඇමති.

1962 මාර්තු 14 දින,
කොළඹදී ය.

### උපලේඛනය

| දිනය | නියෝගය දුන් බලධාරයා | නියෝගය නිකුත් කරණ ලද ද්‍රව්‍ය | නියෝගය පළකරණ ලද ගැසට්පත්‍රය |
|---|---|---|---|
| 61.10.7 | ... මාතර දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක | ... එළුමස් සහ හරක් මස් | ... 61.10.13 වෙනි දින අංක 12,720 |
| 62.2.3 | ... මිළ (ආහාර) පාලක | ... කරවල සහ වියලි ඉස්සෝ | ... 62.2.3 වෙනි දින අංක 12,895 |

3—545

---

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

පහත පෙනෙන උපලේඛනයේ සඳහන් නියෝග මවිසින් අනුමත කරණු ලැබූ බව 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4 වෙනි වගන්තියේ 7 වෙනි අතුරු වගන්තිය යටතේ මෙයින් දනුම දෙමි :—

ටී. බී. ඉලංගරත්න,
වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ ඇමති.

1962. 3. 14 දින,
කොළඹදී ය.

### උපලේඛනය

| දිනය | නියෝගය දුන් බලධාරයා | නියෝගය නිකුත් කරණ ලද ද්‍රව්‍ය | නියාගය පළකරණ ලද ගැසට්පත්‍රය |
|---|---|---|---|
| 61.12.20 | ... මහනුවර දිස්ත්‍රික්කයේ හා නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩ හේවාහැට කොට්ඨාශයේ නියෝජ්‍ය මිළ (ආහාර) පාලක | ... අතිරේක ආහාර ද්‍රව්‍ය | ... 61.12.27 වෙනි දින අංක 12,835 |
| 61.12.20 | ... රත්නපුර දිස්ත්‍රික්කයේ සහකාර මිළ ආහාර පාලක | ... හාල් | ... 61.12.27 වෙනි දින අංක 12,835 |
| 61.12.18 | ... අම්පාරේ දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක | ... අතිරේක ආහාර ද්‍රව්‍ය (උම්බලකඩ හා බොනිටෝ පිෂ්) | 61.12.27 වෙනි දින අංක 12,835 |
| 61.12.29 | ... අම්පාරේ දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක | ... සීනි | ... 62.1.3 වෙනි දින අංක 12,843 |
| 61.12.4 | ... බදුල්ල දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක | ... සීනි (දුඹුරු හා සකස්කළ සුදු) | ... 62.1.6 වෙනි දින අංක 12,848 |
| 61.12.4 | ... මොනරාගල දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක | ... එම | ... 62.1.6 වෙනි දින අංක 12,848 |
| 62.2.3 | ... මාතලේ දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක | ... සකස්කළ සුදුසීනි | ... 62.2.7 වෙනි දින අංක 12,898 |

3—546.

## 1949 අංක 6 දරණ උකස් පනත යටතේ ණයදෙන "ඒජන්සි" ආදිය අනුමත කිරීම සඳහා වන මණ්ඩලයේ සභාපති සහ සාමාජිකවරු

වෂී 1949 යේ අංක 6 දරණ උකස් පනතේ 114 (1) වගන්තිය සහ 1950 මැයි මස 12 දින පළවූ අංක 10,102 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනය යටතේ වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ කටයුතු සඳහා පනවා ඇති මණ්ඩලයේ සභාපති වශයෙන් රජයේ අධිනීතිඥ ආර්. එස්. වනසුන්දර මහතා ද අනිත් සාමාජික වරු වශයෙන් දෙස්තර ඕ. ආර්. මෙඩොන්සා සහ එස්. කී. යටවර යන මහත්වරු ද 1962 මාර්තු 23 වෙනි දින සිට තුන් අවුරුද්දක කාල සීමාවකට ගරු ඇමතිතුමා විසින් පත් කරනු ලැබ ඇති බව මෙයින් නිවේදනය කරමි.

එච්. ඊ. තෙන්නකෝන්,
වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ අතිරේක සථිර ලේකම්.

1962 මාර්තු 20 වැනි දින,
කොළඹ දී ය.

3—808

## 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

### 49 ඡේදය යටතේ සහතිකය

පළාත් පාලන හා නිවාස පිළිබඳ ඇමතිවර, මහානාම සමරවීර වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

මහානාම සමරවීර,
පළාත් පාලන හා නිවාස ඇමතිතුමා.

1962 මාර්තු 7 වැනි දින දීය.
කොළඹ 2.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ආදායම් පාලක කොට්ඨාශයේ කොලොන්නාව අංක 512 දරණ ගම්මුලාදෑනි වසම තුළ, අයි. ඩී. එච්. පාරේ වරිපණම් අංක 58 සහ 62 දරණ ඉඩම්වලින් පහත සඳහන් පරිදි මායිම් ඇති අක්කර 3½ක පමණ ප්‍රමාණයක ඉඩම් කොටසක්.

උතුරට : අයි. ඩී. එච්. පාර සහ විජේසිරි එදිරිසිංහ මහතාට අයිති ඉඩම් ; නැගෙනහිරට : අයි. ඩී. එච්. පාර ; දකුණට : ජී. එමලි නෝනා හා ඉයන් අප්පුහාමිට අයිති ඉඩම් ; බස්නාහිරට : සියඹලාගහවත්ත සහ වරිපණම් අංක 58 දරණ ඉඩමේ ඉතිරි කොටස.

3-547

---

## 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

### 49 ඡේදය යටතේ සහතිකය

පළාත් පාලන හා නිවාස පිළිබඳ ඇමතිවර, මහානාම සමරවීර වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙන් සහතික කරමි.

මහානාම සමරවීර,
පළාත් පාලන හා නිවාස ඇමති තුමා.

1962 මාර්තු 7 වැනි දින දීය,
කොළඹ 2.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, නුවර එළිය දිස්ත්‍රික්කයේ, උඩහේවාහැට ආදායම් පාලක කොට්ඨාශයේ, හඟුරන්කෙත ගම්මුලාදෑනි වසමේ පිහිටි මොන රාගල ඇස්වැද්දුම හේන නැමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති පර්චස් 92ක පමණ ප්‍රමාණයක ඉඩම් කොටසක් :—

උතුරට : ගම්සභා පාර සහ පුද්ගලික ඉඩම් ; නැගෙනහිරට : ගම්සභා පාර සහ පුද්ගලික ඉඩම් ; දකුණට : පුද්ගලික ඉඩම් සහ ප්‍රසිද්ධ පාර ; බස්නාහිරට : ප්‍රසිද්ධ පාර සහ පුද්ගලික ඉඩම්.

3-557

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## දැන්වීමයි

බටහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ අළුත්කුරු කෝරළේ උතුර (ඒ) කරවන ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ ගවයින් අතර, "හෙමරජික් සෙප්ටිසීමියා" නමැති රෝගය පැතිරී යන බැව් 1957 තේ අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥා පනතේ 327 පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ (1) අතුරු වගන්තිය යටතේ මා විසින් වෂී 1960 අගෝස්තු 12 දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද, දැන්වීම අද දින සිට අවලංගු වන බව මහජනයාට මෙයින් දැනුම් දෙමි.

ආරියදාස අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි.

1962 මාර්තු 12 වැනි දින,
පේරාදෙනියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
කායසීාලයේ දී ය.

3-644

## දැන්වීමයි

උතුරු පළාතේ වවුනියා දිස්ත්‍රික්කයේ වවුනියා දකුණ (දෙමළ කොට්ඨාශය) කරවන ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ චෙඩ්ඩිකුලම් ගම්පති කොට්ඨාශයේ ගවයින් අතර; "හෙමරජික් සෙප්ටිසීමියා" නමැති රෝගය පැතිරී යන බැව් 1957 තේ අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥා පනතේ 327 පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ (1) අතුරු වගන්තිය යටතේ මා විසින් වෂී 1961 පෙබරවාරි 17 දින අංක 12,291 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද, දැන්වීම අද දින සිට අවලංගු වන බව මහජනයාට මෙයින් දැනුම් දෙමි.

ආරියදාස අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි.

1962. 3. 12 වැනි දින,
පේරාදෙනියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
කායසීාලයේ දී ය.

3-643

---

## දැන්වීමයි

නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ තම්පලගමම් කරවන ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ කන්තලේ, රාජා ඇල ගවයින් අතර, "හෙමරජික් සෙප්ටිසීමියා" නමැති රෝගය පැතිරී යන බැව් 1957 තේ අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥා පනතේ 327 පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ (1) අතුරු වගන්තිය යටතේ මා විසින් වෂී 1962 ජනවාරි 12 දින අංක 12,875 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද, දැන්වීම අද දින සිට අවලංගු වන බව මහජනයාට මෙයින් දැනුම් දෙමි.

ආරියදාස අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි.

1962 මාර්තු මස 17 වැනි දින,
පේරාදෙණියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
කායසීාලයේ දී ය.

3-645

---

## දැන්වීමයි

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩදුම්බර කරවන ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ කන්ද පහළ කෝරලේ ගම්වල ගවයින් අතර ,"හෙමරජික් සෙප්ටිසීමියා" නමැති රෝගය පැතිරී යන බැව් 1957 තේ අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥා පනතේ 327 පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ (1) අතුරු වගන්තිය යටතේ මා විසින් වෂී 1960. 8. 12 දින අංක 12,182 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද, දැන්වීම අද දින සිට අවලංගු වන බව මහජනයාට මෙයින් දැනුම් දෙමි.

ආරියදාස අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි.

1962 මාර්තු 17 වැනි දින,
පේරාදෙනියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
කායසීාලයේ දී ය.

3-646

---

## 1938 අංක 51 දරන සමාගම් ආඥා පනත

### 277 (5) වගන්තිය යටතේ සීමා සහිත නොදන් ලයිටරේජ් සමාගමේ නම කපා හැරීමේ දැන්වීම

1938 අංක 51 දරන සමාගම් ආඥා පනතේ විධි විධාන යටතේ 1946.10.12 දින සංස්ථාපිත සමාගමක් වන සීමා සහිත නොදන් ලයිට රේජ් සමාගම ව්‍යාපාරික කටයුතුවල නිරත වී නැති බව, නොහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින් ද,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, එ දින සිට තුන් මාසයක් ඉකුත් වූ විට, සීමා සහිත නොදන් ලයිටරේජ් සමාගමේ නම රෙජිස්ටරයෙන් කපා හරින බවට 1961.12.8 දින අංක 12,797 දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙන්, 1961.11.27 දින දරණ දැන්වීමක් පළ කරන ලද හෙයින් ද,

සීමාසහිත නොදන් ලයිටරේජ් සමාගම ඉහත කී තුන් මාසයේ කාල සීමාව තුළ එසේ නොකිරීමට හේතු දක්වා නොමැති බැවින් ද,

අද දින, සීමාසහිත නොදන් ලයිටරේජ් සමාගමේ නම සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින ලද බව ද, ඉහත කී සමාගම විසිරුවා හරින ලද බවද, වෙළඳ සමාගම් රෙජිස්ත්‍රාර් තැන්පත් වෝල්ටර් මහේස සෙල්ලයියා වන මම, 1938 අංක 51 දරන සමාගම් ආඥා පනතේ 277 (5) වැනි වගන්තිය යටතේ, මෙම දැන්වීමෙන් ප්‍රකාශ කරමි.

ඩබ්ලිව්. ඇම්. සෙල්ලයියා,
වෙළඳ සමාගම් රෙජිස්ත්‍රාර්.

1962.3.14 වැනි දින දීය.

3-572

---

ඇල්. ඞී.—ඞී 60/34.

අංකය : 1/3/11/ජීසී.

## රේගු නිවේදනය—බැඳි ගුදම 62/2

### රේගු ආඥාපනත

රේගු ආඥා පනතෙහි (235 වෙනි අධිකාරය) 69 වෙනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබූ බලතල අනුව ප්‍රධාන රේගු අයකැමි තැන්පත් මැක්සිම් ලූෂියන් ඩිඩෝ කැස්පර්ස් වන මම, ඒ වගන්තියෙන් ගරු මුදල් ඇමති තුමා වෙත පැවරී ඇති බලය ප්‍රකාර ප්‍රදානය කරනු ලැබූ එතුමාගේ අනුමතිය ඇතිව, එතුමාගේ විධානයන් අනුව, පළ කරනු ලබන මේ නිවේදනයෙන්,

(අ) කොළඹ හල්ස්ඩෝර්ප් හි මිල් වීදියේ අංක 21 දරන ස්ථාන යෙහි පිහිටි (විශාලත්වය 23′ 6″×22′ 3″) අංක 3 ගබඩාව ඉහත සඳහන් වගන්තිය යටතේ අනුමත කිරීමේ හා පත්කිරීමෙ නිවේදනය මෙයින් අවලංගු කරමි; තවද

(ආ) කොළඹ, හල්ස්ඩෝර්ප් හි මිල් වීදියේ අංක 21 දරන ස්ථාන යේ පිහිටි විශාල කරන ලද (විශාලත්වය 52′ 2″×30′ 2″) අංක 3 ගබඩාව සීමාසහිත බරියන්ට් (ලංකා) සමාගම විසින් ගෙන්වනු ලබන සිගරැට්, මුද්‍රිකපාන, ස්පිරිතු හා යව මත් ද්‍රව්‍ය, ප්‍රථම ආනයන සටහන් මත තීරු බදු නොගෙවා ගුදම් කිරීම හා ආරක්ෂා සැලසීම කළහැකි ගුදමක් වශයෙන් අනුමත කර පත්කරමි.

ඇම්. ඇල්. ඞී. කැස්පර්ස්,
ප්‍රධාන රේගු අයකැමි.

1962 මාර්තු 9 වන දා කොළඹ.

3-570

---

## ප්‍රකාශනයයි

වයඹ පළාතේ හලාවත දිස්ත්‍රික්කයේ පිටිගල් කොරලේ උතුර කරවන ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ ගල්මුරුව ගම්පති කොට්ඨාශයේ ගවයන් අතර "මුව සහ කුර" නමැති රෝගය පැතිරී යන බැවින්, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන්පත් ආරිය දස අමරසිංහ වන මම 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥා පනතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව පහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශය බෝවෙන රෝග ඇති ප්‍රදේශයක් කොට සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි.

උතුරට : බිංගිරිය ගම්පති කොට්ඨාශය; දකුණට : කඩුපිටිය ඔය; නැගෙනහිරට : කොම්පාස් පාර; බස්නාහිරට : කුදිරුප්පුව; උරලිය සහ කරුක්කු වතුවාන ගම්පති කොට්ඨාශ.

2. මෙම ආඥා පනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුළත ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයන් හෝ ගවයන් බඳිනා ලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙන යෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්මත කරන ලද "සතුන්ගේ බෝවෙන රෝග" පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශයක ඒ ඒ නිලධාරීන් විසින් නීත්‍යානුකූලව ක්‍රියා කරන අයුරු ගව හිමියන් හා කරත්ත කරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීති රීති සම්බන්ධව වැඩි විස්තර හලාවත පශු වෛද්‍යතැනගෙන් හෝ පිටිගල් කෝරලේ උතුර කරවන ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැනගේ කායභාලයෙන් ලබාගත හැකි බව මෙයින් වැඩි දුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වලංගු වන බව දත යුතු යි.

ආරියදස අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන.

1962 මාර්තු 13 වැනි දින,
පේරාදෙනියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
නිලධාරි තැනගේ කායභාලයේදී ය.

3-538

---

## රථවාහන ගමනාගමනයට බාධා

### දකුණු කොළඹ දිස්ත්‍රික්කයේ එළුවිල-අරුග්ගොඩ පාරේ අංක 2/1 දරණ බෝක්කුව වසා තැබීම

එළුවිල-අරුග්ගොඩ පාරේ අංක 2/1 දරණ බෝක්කුව, 1962 මාර්තු මස 24 වෙනි දින සිට 1962 අප්‍රියෙල් මස 30 වෙනි දින දක්වා රථ වාහන ගමනාගමනයට නොහැකිවනසේ, වසා තබන බැව් සාමාන්‍ය මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

අළුබෝමුල්ල-අළුත්ගම මාර්ගය ඉහත සඳහන් මාර්ගය වෙනුවට යොදාගත හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

1962 මාර්තු මස 19 වෙනි දින,
කොළඹ, රජයේ වැඩ කායභාලයේදීය.

3-747

ලංකාවේ වැලව්ටෙවිතයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි